අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி, விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
Ministry of Education, Science and Technology
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/4/58/16/01/14
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2024.10.

…………………………… හිමි/මයා/මිය/මෙය

………………………..
………………………..
………………………..
………………………..

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම 2021(2024) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම</u>**

අංක: 1928/28 හා 2015.08.21 දිනැති ගැසට් පත්‍රයේ පළකර ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2023.07.29 දින පවත්වන ලද විවෘත තරඟ විභාගයට අදාළ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වූ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික සම්මුඛ පරීක්ෂණයට ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වමි.

02. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත .............. දින පෙ.ව/ප.ව …………….. ට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

03. එදිනට පහත සඳහන් සියලුම ලිපි ලේඛනවල මුල් පිටපත් ඇතුළත් ගොනුවක් ද, එම ලිපි ලේඛන පිටපත් මත ඒවා සත්‍ය පිටපත් බවට අයදුම්කරු විසින් සහතික කරන ලද (සටහන 01 බලන්න) ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපී ගොනුවක් ද (අංක II සිට VII දක්වා), සම්පූර්ණ නම සහ මාධ්‍යය සඳහන් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

I. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය

II. ජාතික හැඳුනුම්පත /විදේශ ගමන් බලපත්‍රය

III. උප්පැන්න සහතිකය

IV. දිවුරුම් ප්‍රකාශය (අවශ්‍යතාවය අනුව) - අදාළ අධ්‍යාපන සහතික සහ අනෙකුත් සහතික/ ලේඛනවල සඳහන් නම්වල වෙනස්කම් පවතී නම් ඊට අදාළ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.

V. අධ්‍යාපන සහතික -
- අ.පො.ස සාමාන්‍ය පෙළ } ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද
- අ.පො.ස උසස් පෙළ }
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධි සහතිකය හා සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය

VI. මේ වන විට රාජ්‍ය ආයතනයක සේවය කරනු ලබන නිලධාරියෙකු නම් සේවය සනාථ කරන ලද ලිපිය (ඇත්නම්)

VII. මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } +94112784811 +94112785162 secretary.education@moe.gov.lk moesecretaryoffice@gmail.com

04. අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර (2021.07.30) සම්පූර්ණ කර තිබිය යුතුය. ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් ම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතරම, අදාළ අධ්‍යාපන සුදුසුකම් ඉල්ලුම් කරන භාෂා මාධ්‍යයෙන්ම ලබාගෙන තිබීම අත්‍යවශ්‍ය නොවේ.

05. අංක 2,237 හා 2021.07.16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති බඳවා ගැනීමේ නිවේදනය සහ ඔබගේ අයදුම්පත්‍රය අනුව මූලික සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සියලුම සහතිකපත්/ ලේඛන සහ සහතික කරන ලද ඡායා පිටපත් එදිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත්/ ලේඛන පිළිබඳව සලකා බලනු නොලැබේ.

06. අදාළ උපාධි සහතිකවල විස්තරාත්මක ප්‍රතිඵල ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කලයුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන සහතික හෝ ලේඛණ පිළිබඳව සලකා බලනු නොලැබේ.

07. අධ්‍යාපන සුදුසුකම් සපුරාලනුයේ විදේශ විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම්, අදාළ විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් බවට එම කොමිෂන් සභාව විසින් නිකුත් කළ ලිපියක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන එවැනි ලිපි නැවත ලිපි නැවත සලකා බලනු නොලැබේ.

08. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව පවත්වන වාචික පරීක්ෂණයේ දී එම අවස්ථාවේ ලබා දෙන සිද්ධි අධ්‍යයනයක් පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට ලකුණු ලබා දීම සිදු කෙරේ.

| | | |
|---|---|---|
| 01 | තර්කනය හා ගැටළු විසඳීම | ලකුණු 10 |
| 02 | සන්නිවේදන කුසලතාවය | ලකුණු 10 |
| 03 | පෞරුෂත්වය | ලකුණු 05 |
| | | මුළු ලකුණු 25 |

09. ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලැබීම හෝ සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීමට සුදුසුකමක් නොවන බව කාරුණිකව දන්වමි.

10. තවද, මෙම ලිපිය ලද වහාම සතියේ දිනයන්හි රාජකාරි වේලාවක දී 0112-787330/ 0112-786674 යන දුරකථන අංකයට ඇමතුමක් ලබා දෙමින් ලිපිය ලද බව තහවුරු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

11. සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආර්.ඩී. ජමින්ද<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>(අධ්‍යාපන සේවා ආයතන)

අත්.කළේ: ජේ.එම්. තිලකා ජයසුන්දර<br>ලේකම්

**අවධානයට:** නියමිත දින මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම් ඒ සඳහා වෙනත් දිනයක් ලබා නොදෙන හෙයින් එවැනි ඉල්ලීම් සලකා නොබලන අතර, අදාළ ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අවස්ථාවේ දී අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

**සටහන 01**: රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක සේවය කරන අයදුම්කරුවකු ඉහත අංක (03) හි දක්වා ඇති ලේඛන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික රජයේ නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී ලත් නිලධාරියෙකු, රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍යස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.